# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2325/44 - 2023 මාර්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 13/1978 (III)

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

ශ්‍රේෂ්ඨාධිකරණ රීති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ අග්‍ර විනිශ්චයකාරවරයා විසින් සහ එම ව්‍යවස්ථාව යටතේ ඔහු විසින් නම් කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයන් විසින් සාදනු ලබන රීති.

**ජයන්ත ජයසූරිය,**
අග්‍ර විනිශ්චයකාර.

**වී. කේ. මලල්ගොඩ,**
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

**එම්. එන්. බී. ප්‍රනාන්දු,**
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

**කේ. කේ. වික්‍රමසිංහ,**
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

2023 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. 1978 සැප්තැම්බර් මස 07 වැනි දින අංක 1/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1978 විනිශ්චයකාරවරයන්ගේ හා නීතිඥවරයන්ගේ ඇඳුම පිළිබඳ රීති, එහි 7 වන රීතිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ. :-

"7. (1) නීතිඥවරියන්ගේ ඇඳුම පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(අ) සුදු, කළු, අව-සුදු (off-white), අළු හෝ ළා දම් (mauve) පැහැති සාරිය සහ හැට්ටය ; හෝ

(ආ) කළු පැහැති කලිසම සමග සුදු පැහැති බ්ලවුසය සහ කළු පැහැති කබාය සහ සපත්තු ; හෝ

(ඇ) කළු පැහැති සාය සමග සුදු පැහැති බ්ලවුසය සහ කළු පැහැති කබාය සහ සපත්තු.

(2) (අ) (1) වන අනු-රීතියේ (ආ) ඡේදයේ සඳහන් කලිසම වළලුකර දක්වා වූ දිග ප්‍රමාණයකින් තිබිය යුතු ය.

(ආ) (1) වන අනු-රීතියේ (ඇ) ඡේදයේ සඳහන් සාය, අසුන්ගෙන සිටින විට දණහිසට පහතින් වැටෙන සේ දිග ප්‍රමාණයකින් තිබිය යුතු ය.

(ඇ) (1) වන අනු-රීතියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් බ්ලවුසය උස් කර සහිතව සහ අත් දිගට තිබිය යුතු ය.".

2. 2018 ඔක්තෝබර් මස 05 වැනි දින අංක 2091/72 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2018 විනිශ්චයකාරවරයන්ගේ හා නීතිඥවරයන්ගේ නිල ඇඳුම පිළිබඳ රීති මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

EOG 03 - 0397

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.